**ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයින් තෝරා පත් කර ගැනීමේ මැතිවරණය 2020**

01. හැඳින්වීම -

"ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු මැතිවරණය - 2020" ආශ්‍රයෙන් නිකුත් කරන ලද අංක - ජා.ත.සේ.ස/වි.ව්‍යා/යො.පා/2020 දරණ 2020.01.27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව එහි අරමුණු පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු මැතිවරණය ඔස්සේ ශ්‍රී ලාංකේය තාරුණ්‍යය වෙත තරුණ පාර්ලිමේන්තු නියෝජිතයෙකු වශයෙන් තේරී පත්ව කටයුතු කිරීම සඳහා අවස්ථාව සලසා ඇත. ඒ අනුව ඉහත කී තරුණ නියෝජිතයින් තෝරා පත් කර ගැනීම මැතිවරණ අවස්ථා දෙකක දී සිදු වේ.

එහි පළමු අවස්ථාව වශයෙන් දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා ම නියෝජිතයින් 331 ක් 2020.02.22 වන දින ඉලෙක්ට්‍රොනික් ක්‍රමවේදය යටතේ ඡන්දය පවත්වා තෝරා පත් කර ගනු ඇත. එහි අපේක්ෂකත්වය වයස අවුරුදු 18-27 අතර ශ්‍රී ලාංකේය පුරවැසි තරුණ තරුණියන් වෙත ලබා දී ඇති අතර ඡන්ද හිමියන් වශයෙන් යෞවන සමාජ ක්ෂේත්‍රය නියෝජනය කරන වයස් කාණ්ඩය ලෙස 15-29 හා අනෙකුත් තාරුණ්‍යය සඳහා වයස අවුරුදු 18-29 ත් අතර තරුණ තරුණියන් වෙත අවස්ථාව ලබා දී ඇත.

ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ නියෝජිතයින් තෝරා ගැනීමේ දෙවන අවස්ථාව ලෙස ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන තුළ අධ්‍යයන කටයුතු සිදු කරන විද්‍යාර්ථීන් අතරින් ඉහතකී මැතිවරණ ක්‍රමවේදය (ඉලෙක්ට්‍රොනික් ඡන්ද භාවිතය) ඔස්සේ නියෝජිතයින් 28 දෙනෙකු තෝරා පත් කර ගැනීමට සැලසුම් කර ඇත. මෙහිදී ඡන්ද දායකයින් ලෙස විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් කටයුතු කරනු ඇත.

ඒ අනුව දිවයිනේ ඉහත වර්ගීකරණයට අයත් ආයතන 22 ක තරුණ පාර්ලිමේන්තු මැතිවරණය ක්‍රියාත්මක වේ.

02. ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ අරමුණු

I. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් හඳුනාගෙන ඇති තරුණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
II. තරුණ අදහස් හා මතවාදයන්ට ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඉඩ ප්‍රස්ථාව ලබා දීම.
III. ගෝලීයකරණය හමුවේ සමාජය තුළ සිදුවන ආර්ථික, දේශපාලන, සංස්කෘතික, සමාජයීය හා පාරිසරික වෙනස්කම්වලට සංවේදී තරුණ ප්‍රජාවන් නිර්මාණය කිරීම.
IV. නව තාක්ෂණය හා සන්නිවේදන ක්ෂේත්‍රයන්ගෙන් සමාජයට එල්ල වන බලපෑම් හඳුනාගැනීම හා එයින් සිදු වන බලපෑම සාධනීය ලෙස රටේ ප්‍රගමනය උදෙසා යෙදවීම.
V. තරුණයන්ගේ දැනුම ආකල්ප කුසලතා සංවර්ධනය කර ගැනීම සඳහා තරුණ පාර්ලිමේන්තුව පූර්වාදර්ශයක් සපයන ස්ථානයක් බවට පත් කිරීම.
VI. ජාතික සංවර්ධන කාර්යයේ දී තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සක්‍රීයව කටයුතු කරන නියෝජිතයෙකු ලෙස බලගැන්වීම.

VII. සමස්ත තාරුණ්‍යයේ නව අදහස් හා මතවාද කථිකාවට ලක් වන බුද්ධිමය හා සංවාදශීලී තරුණ මණ්ඩලයක් බවට තරුණ පාර්ලිමේන්තුව පත් කිරීම.

VIII. යෞවන සමාජ ව්‍යාපාරය හා බද්ධ වෙමින් යෞවන සමාජ ව්‍යාපාරයට මාර්ගපෙදේශයක් සපයන ව්‍යාවස්ථාමය හා ප්‍රතිපත්ති සම්පාදන ඒකකයක් ලෙස ක්‍රියා කිරීම හා යෞවන සමාජ ව්‍යාපාරය තුළ සක්‍රීය තරුණ සහභාගීත්වය හා දායකත්වය වැඩි දියුණු කිරීම.

IX. 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතේ අරමුණු සාක්ෂාත් කරලීම.

X. මනා පෞරුෂයකින් යුක්ත තරුණ නායකයෙකු බිහි කිරීමත් හිංසනයෙන් තොර ප්‍රජතාන්ත්‍රික රාමුවක් තුළ ගැටලු විසඳා ගැනීම සඳහා තරුණයා බල ගැන්වීමත් ජාතික දේශපාලනය සඳහා නැඹුරුවක් දක්වන තරුණ තරුණියන් හට අවශ්‍ය මඟ පෙන්වීම.

XI. ජාතික හා ජාත්‍යන්තර තරුණ ක්‍රියාකාරකම් ආශ්‍රිත අත්දැකීම් ලබා දීම.

03. ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයින් තෝරා පත් කර ගැනීමට ඡන්ද බලය හිමි වන විශ්වවිද්‍යාල සහ ඊට අයත් නියෝජිත සංඛ්‍යාව

| අනු අංකය | විශ්වවිද්‍යාලය | නියෝජිත සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ විශ්වවිද්‍යාලය | 02 |
| 02 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 02 |
| 03 | මොරටුව විශ්වවිද්‍යාලය | 02 |
| 04 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 01 |
| 05 | ශ්‍රී ලංකා සෞන්දර්ය විශ්වවිද්‍යාලය | 01 |
| 06 | ශ්‍රී ලංකා නීති විද්‍යාලය | 01 |
| 07 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) | 01 |
| 08 | ශ්‍රී ලංකා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පාසල (NSBM) | 01 |
| 09 | ශ්‍රී ලංකා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ආයතනය (NIBM) | 01 |
| 10 | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) | 01 |
| 11 | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය (UNIVO TEC) | 01 |
| 12 | ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය (SLTC CAMPUS) | 01 |
| 13 | යාපනය විශ්වවිද්‍යාලය | 01 |
| 14 | රුහුණු විශ්වවිද්‍යාලය | 02 |
| 15 | නැගෙනහිර විශ්වවිද්‍යාලය | 01 |
| 16 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 01 |
| 17 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 01 |
| 18 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 01 |
| 19 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 01 |
| 20 | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 01 |
| 21 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 02 |
| 22 | කැලණිය විශ්වවිද්‍යාලය | 02 |
| එකතුව | | 28 |

04. ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයින් තෝරා පත් ගන්නා මැතිවරණය ක්‍රියාත්මක කරන ක්‍රමවේදය

ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයින් තෝරා ගැනීමේ දී එම කාර්යය පරිගණක මෘදුකාංග භාවිතයෙන් ඉලෙක්ට්‍රොනික් ඡන්ද ප්‍රකාශය කිරීමේ ක්‍රමවේදය තුළ ක්‍රියාත්මක වේ. එහිදී වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී අයුරින් තමාගේ නියෝජිතයා තෝරා පත්කර යැවීමට ශ්‍රී ලාංකේය තරුණ තරුණියන් හට ඡන්ද දායකයෙකු ලෙස ඉදිරිපත් වීමේ ඉඩප්‍රස්ථාව සලසා ඇත.

ඒ අනුව ඡන්ද දායකයින් සහ අපේක්ෂකයින් හඳුන්වාදෙනු ලබන වෙබ් පිටුවක ලියාපදිංචි වීම අත්‍යාවශ්‍ය වේ.

05. ඡන්ද අපේක්ෂකයින් සහ ඡන්ද දායකයින් ලියාපදිංචි විය යුතු ආකාරය

I. ඡන්ද දායකයින් ලියාපදිංචි වීම.

ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ ඡන්ද දායකයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා www.nysc.lk වෙබ් අඩවිය හඳුන්වා දී ඇත. ඒ අනුව එම වෙබ් අඩවිය සඳහා පිවිස ඉල්ලා ඇති තොරතුරු ඇතුළත් කිරීමෙන් ලියාපදිංචි වීම සඳහා අවස්ථාව සලසා ඇත.

i. ඡන්ද දායකයෙකු ලෙස ඉදිරිපත් වීමට ඇති සුදුසුකම්

අ) මෙම ලේඛනයේ අංක 3 යටතේ දක්වා ඇති විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රථම උපාධිය හෝ පාඨමාලාක් සඳහා ඇතුළත්ව ඇති අභ්‍යන්තර ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක විය යුතු ය.

ආ) 2020.03.01 වන දිනට වයස අවුරුදු 18 – 29 ත් අතර විය යුතු ය. (එනම් 1991.03.01 සිට 2002.03.01 දක්වා කාල සීමාව තුළ උපන් අයෙකු විය යුතු ය.)

ඇ) ඡන්දය භාවිතයේ දී අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඡන්ද දායකයින් විසින් තම ජාතික හැඳුනුම්පත හා ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු හෙයින් ඒ යටතේ සුදුසුකම්ලත් අය විය යුතු ය.

සැ.යු : ඡන්ද දායකයෙකු ලෙස ලියාපදිංචි වීමට පදිංචි දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ග්‍රාම නිලධාරී වසම සලකා නො බලන අතර ඉහත කරුණු පමණක් සුදුසුකම් ලෙස සැලකේ.

ii. ඡන්ද අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීමට සුදුසුකම්

අ) මෙම ලේඛනයේ අංක 3 යටතේ දක්වා ඇති විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සඳහා ඇතුළත්ව ඇති අභ්‍යන්තර ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක විය යුතු ය. (ඒ බව සනාථ කිරීම සඳහා පීඨාධිපති විසින් සහතික කරනු ලබන ලිපිය ඉදිරිපත් කළ යුතු ය.)

ආ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

ඇ) තරුණ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ලියාපදිංචි ඡන්ද දායකයෙකු විය යුතු ය.

ඇ) 2020.03.01 වන දිනය වයස අවුරුදු 18-27 අතර විය යුතු ය. (එනම් 1993.03.01 සිට 2002.03.01 දක්වා කාල සීමාව තුළ උපන් අයෙකු විය යුතු ය.)

ඉ) කිසියම් විෂමාචාර ක්‍රියාවක් හෝ විනය විරෝධී ක්‍රියාවක් ආශ්‍රයෙන් හෝ විශ්වවිද්‍යාල නීති පද්ධතියට පටහැනි ක්‍රියාවක නො යෙදුණු හා ඉහත කරුණු ආශ්‍රයෙන් දඬුවම් ලබා ඇති අයෙකු නො විය යුතු ය. (එය උප කුලපතිවරයා විසින් සහතික කරන ලද ලිපියක් ඔස්සේ සනාථ කළ යුතු ය)

ඊ) තම අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත මගින් සහ ශිෂ්‍ය හැඳුනුම්පත මගින් සනාථ කළ හැකි අයෙකු විය යුතු ය.

උ) මීට ඉහත දී ජාතික තරුණ සේවා සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා යෞවන පාර්ලිමේන්තුව/ ශ්‍රී ලංකා යුත් පාර්ලිමේන්තුව/ ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුව යන අවස්ථා නියෝජනය නො කළ අයෙකු විය යුතු ය.

ඌ) අයදුම් කරනු ලබන අපේක්ෂකයෙකුගේ මව/ පියා/ සහෝදරයා/ සහෝදරිය යම් දේශපාලන පක්ෂයක් නියෝජනය කරමින් හෝ ස්වාධීනව මහජන නියෝජිතයෙකු ලෙස කටයුතු කරන්නේ නම් ඔහුහෝ ඇය වෙත නාම යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව අහිමි වේ.

සැ.යු : තරුණ පාර්ලිමේන්තු ඡන්ද අපේක්ෂකයෙකු වීම උදෙසා ඉහත අවශ්‍යතාවයන් පමණක් සලකා බලනු ලබන අතර එම අවශ්‍යතාවයන් තුළ කරුණු සනාථ කිරීම සඳහා ඉල්ලා ඇති ලිපි හෝ සහතික නාම යෝජනා පත්‍රය සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

06. නාම යෝජනා භාර ගැනීම

ඉහත අංක 5 යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයට නාම යෝජනා ඉදිරිපත් කළ හැකි ය. නාම යෝජනා පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු සියලුම වාර්තා ඉදිරිපත් කිරීමත් නාම යෝජනා පත්‍රයේ සත්‍ය කරුණු දැක්වීමත් අපේක්ෂකයන් සතු වගකීම වේ. ඡන්දය ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනය පරිශ්‍රය තුළ තෝරා ගත් ස්ථානයක දී නාම යෝජනා කමිටුවක් වෙත නාම යෝජනා ඉදිරිපත් කළ යුතු අතර කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ඡන්දය ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල 12 ක් සඳහා පමණක් නාම යෝජනා භාර ගැනීම ජාතික තරුණ සේවා සභාවේ තරුණ මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ දී එක් නාම යෝජනා මණ්ඩලයක් මගින් කටයුතු සිදු වේ. නාම යෝජනා මණ්ඩලය සම්බන්ධීකරණය ඒ ඒ පාලන ඒකකයන්ට අයත් ජාතික තරුණ සේවා සභාවේ පළාත් අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ කොට්ඨාශභාර තරුණ සේවා නිලධාරීවරුන් යටතේ සිදුවනු ඇත.

සැ.යු : ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු අපේක්ෂක නාම යෝජනා පත්‍රය ආකෘති අංක 1 යටතේ මේ සමග ඉදිරිපත් කර ඇත.

I. නාම යෝජනා පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු වාර්තා
   i. ජාතික හැඳුනුම්පත සහ ශිෂ්‍ය හැඳුනුම්පතේ සහතික කළ පිටපත්
   ii. විශ්වවිද්‍යාලය තුළ විෂමාචාර ක්‍රියා හෝ විනය විරෝධී ක්‍රියා නොමැති ශිෂ්‍යයෙකු බවට පීඨාධිපතිවරයා විසින් නිරදේශ කළ, උපකුලපතිවරයා විසින් අනුමත කරන ලද ලිපිය
   iii. පීඨාධිපතිවරයා විසින් පාඨමාලාව හදාරනු ලබන බව සහතික කළ ලිපිය

II. නාම යෝජනා භාර ගන්නා දිනය - 2020.02.25
කාලය - පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා

III. මැතිවරණ ප්‍රචාරණ කටයුතු

මැතිවරණ ප්‍රචාරණ කටයුතු 2020.02.25 දිනෙන් ආරම්භ වන අතර, ප්‍රචාරණ කටයුතු සඳහා බැනර්, පෝස්ටර්, කටවුට් හෝ පොලිතීන් භාවිතා නො කළ යුතු ය. ප්‍රචාරක කාර්යයේ දී තමා පිළිබඳ හඳුන්වා දීම හැරුණු කොට අනෙකුත් අපේක්ෂකයන්ට විවේචනය කිරීම හා යම් පාර්ශවයක් අගතියක් සිදුවන ආකාරයෙන් ප්‍රචාරණ කටයුතු සිදුකිරීම ප්‍රතිපත්තියක් ලෙස ඉටු නො කිරීමට වග බලා ගත යුතු ය.

IV. නාම යෝජනා මණ්ඩලයේ සංයුතිය

<u>කොළඹ දිස්ත්‍රික්කය සඳහා</u>

i. දිස්ත්‍රික් ලේකම් / තේරීම් භාර නිලධාරී හෝ නියෝජිත
ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ නියෝජිත
iii. ජාතික තරුණ සේවා සභාවේ බටහිර පළාත් අධ්‍යක්ෂ හෝ නියෝජිත
iv. ජාතික තරුණ සේවා සභාවේ කොළඹ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ
v. ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ලේකම් හෝ නියෝජිත

<u>අනෙකුත් දිස්ත්‍රික් සඳහා</u>

i. ඡන්දය ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් / සහකාර තේරීම් භාර නිලධාරී හෝ නියෝජිත
ii. ජාතික තරුණ සේවා සභාවේ පළාත් අධ්‍යක්ෂ හෝ නියෝජිත
iii. ජාතික තරුණ සේවා සභාවේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ
iv. යෞවන සමාජ සම්මේලනයේ ජාතික මණ්ඩල නියෝජිත
v. යෞවන සමාජ දිස්ත්‍රික් මණ්ඩල සභාපති හෝ නියෝජිත

V. නාම යෝජනා මණ්ඩලයේ බලතල හා ක්‍රියාකාරකම්

i. නාම යෝජනා භාර ගැනීම.
ii. නාම යෝජනා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.
iii. මැතිවරණ කටයුතු නිරීක්ෂණය කිරීම හා මැතිවරණ නීතිරීති උල්ලංඝනය වන අවස්ථාවන්හී දී ඒ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම, එම කටයුතු පාලනය සඳහා උපදෙස් ලබා දීම සහ වාර්තා කිරීම.
iv. මැතිවරණ කාර්යය මණ්ඩල නම් කිරීම.
v. මැතිවරණය ක්‍රියාත්මක කිරීම.
vi. මැතිවරණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවා පහසුකම් සැලසීමේ සම්බන්ධීකරණය.
vii. මැතිවරණ අක්‍රමිකතා තත්වයන් පිළිබඳව පැමිණිලි භාර ගැනීම හා විභාග කිරීම, ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ ජාතික මැතිවරණ කමිටුව වෙත නිර්දේශ ලබා දීම.

VI. මැතිවරණය පැවැත්වෙන ආකාරය

මෙම ලේඛනයේ අංක 3 මගින් දක්වා ඇති සියලුම විශ්වවිද්‍යාල/ ආයතන ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ නියෝජතයින් තෝරා ගැනීමේ ඡන්ද බලප්‍රදේශ ලෙස සලකනු ලැබේ. ඒ අනුව ඉදිරිපත් කර ඇති සුදුසුකම් යටතේ ඡන්ද දායකයින් ලෙස ලියාපදිංචි වීමට ඉල්ලා සිටීමටත් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වීමටත් නියෝජනය

කරන විද්‍යාර්ථීන් හට අවස්ථාව හිමි වේ. එසේ නීත්‍යානුකූලව තහවුරු කර ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට ඡන්ද දායකයින් ලෙස ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා දක්වා ඇති විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉදිරිපත් සුවිශේෂී කාරණා මත ඡන්දපොළ කමිටුවේ නිර්දේශයෙන් සකස් කරනු ලබන ආසන්න ස්ථානයක දී පිහිටුවනු ලබන ඡන්ද මධ්‍යස්ථානයක දී ඡන්දය ප්‍රකාශ කළ හැකි ය.

i. ඒ අනුව ඡන්ද පොළ කමිටුව පහත සඳහන් පරිදි සකස් වේ.
   - සහකාර තේරීම් භාර නිලධාරී/ප්‍රාදේශීය ලේකම්
   - ඡන්දය ක්‍රියාත්මක කරන විශ්වවිද්‍යාලයේ උපකුලපති හෝ නියෝජිත
   - සහකාර ප්‍රාදේශීය ලේකම් / ඡන්ද මධ්‍යස්ථානාධිපති
   - දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ හෝ නියෝජිත
   - කොට්ඨාශ භාර තරුණ සේවා නිලධාරී
   - යෞවන සමාජ ජාතික මණ්ඩල නියෝජිත

ii. ඡන්දපොළ කාර්යය මණ්ඩලය
   - සහකාර ප්‍රාදේශීය ලේකම්/ජ්‍යෙෂ්ඨ ඡන්ද මධ්‍යස්ථානාධිපති
   - විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී/උප ඡන්ද මධ්‍යස්ථානාධිපති
   - කළමනාකරණ සේවයේ නිලධාරීන් තිදෙනෙකු
     - ලියාපදිංචිය තහවුරු කිරීම
     - අනන්‍යතාවය තහවුරු කර ගැනීම
     - ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සහ ඇඟිලි පාට කිරීම
   - තොරතුරු තාක්ෂණ නිලධාරීන් තිදෙනෙක්
     - විශ්වවිද්‍යාලය
     - ජාතික තරුණ සේවා සභාව
     - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
   - ආරක්ෂක නිලධාරීන් (මධ්‍යස්ථානයේ අවශ්‍යතාවය පරිදි)
   - සහය කාර්ය මණ්ඩලය දෙදෙනෙක්

iii. ඡන්දපොළ කාර්යය මණ්ඩලයේ කාර්යයභාරය
   - ඡන්දය පැවැත්වෙන දින නියමිත වේලාව තුළ මැතිවරණ කටයුතු ක්‍රියාත්මක කිරීම
   - මැතිවරණයට අදාළ පොදු උපදෙස් ඡන්ද අපේක්ෂකයින් දැනුවත් වන ආකාරයෙන් ප්‍රදර්ශනය කිරීම.
   - මැතිවරණ කාල සීමාව තුළ ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රය ආශ්‍රිතව සාමකාමී අයුරින් කටයුතු පවත්වාගෙන යාමට ඉඩ සැලසීම
   - ප්‍රමාදයකින් තොරව ඉලෙක්ට්‍රොනික් ක්‍රමවේදය යටතේ ඡන්දය පවත්වාගෙන යාමට අවශ්‍ය සේවා පහසුකම් සලසා ගැනීම.
   - ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශ කිරීම.
   - ඡන්ද මධ්‍යස්ථානය තුළ භාවිතයට ගැනෙණ සියලු දත්තයන් හා ඡන්ද පත්‍රිකා සුරක්ෂිතව තබා ගැනීම.
   - රහස්‍යභාවය සුරැකීම සහ විනිවිධභාවයෙන් යුතුව කටයුතු කිරීම.
   - ඡන්ද මධ්‍යස්ථානය තුළ හඳුනාගැනීමේ නාම පුවරු යෙදීම.
   - මැතිවරණ රාජකාරි සඳහා සම්ප්‍රදායානුකූලව භාවිත කරනු ලබන ඇඳුම්වලින් සැරසී සිටීම.

07. ඡන්දය ප්‍රකාශ කරන ආකාරය

I. සෑම ඡන්ද දායකයෙකු ම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා 2020.03.02 වන දින ඔහුට හෝ ඇයට අයත් ඡන්ද මධ්‍යස්ථානය වෙත පෙ.ව. 8.30 ත් ප.ව. 4.30 ත් කාල සීමාව තුළ පැමිණිය යුතු ය.
II. තම අපේක්ෂකයා වෙත ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ප්‍රථමයෙන් ම තම අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හා ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කර තහවුරු කර ගත යුතු ය.
III. ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වී ඇත්දැයි තහවුරු කර ගත යුතු ය.
IV. ඡන්ද පත්‍රිකාව ලබා ගැනීම සහ ඇඟිල්ල පාට කිරීම තුළින් ඡන්දය ප්‍රකාශ කිරීම සහතික කරගත යුතු ය.
V. ඡන්දය ප්‍රකාශ කිරීම සකස් කර ඇති පරිගණකය වෙත ගොස් ඉලෙක්ට්‍රොනික් ක්‍රමවේදය යටතේ ඡන්දය භාවිතා කර ඉන් අනතුරුව එම ස්ථානයේ ඇති මේසය තුළ දී ඡන්ද පත්‍රිකාව අපේක්ෂක අංකය හා නාමය යටතේ සලකුණු කර ඡන්ද පෙට්ටියට දැමිය යුතු ය.
VI. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටව යා යුතු ය.

08. ඡන්දය ගණන් කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම

ඉලෙක්ට්‍රොනික් ඡන්ද යෙදීම පරිගණක දත්ත භාවිතයෙන් සිදුවන කාලය අතරතුර ඡන්ද ප්‍රකාශ වීම පිළිබඳ නිරීක්ෂණ ජාතික මැතිවරණ කමිටුව ඔස්සේ මහරගම තරුණ සේවා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී සිදු කරනු ලබයි. ඒ අනුව, ජාතික මධ්‍යස්ථානයෙන් ස්වයංක්‍රීයව ඡන්ද ගණනය කිරීම සිදු වේ. ඡන්දය අවසන් වී කෙටි කාල සීමාවක් තුළ ප්‍රතිඵල නිකුත් කරනු ඇත.

09. ඡන්ද ප්‍රතිඵලය සම්බන්ධයෙන් විරෝධතා / පැමිණිලි ඉදිරිපත් කිරීම

ජාතික මැතිවරණ මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් ඉලෙක්ට්‍රොනික ගණනයට අනුව ඉදිරිපත් කරනු ලබන ප්‍රතිඵලය සම්බන්ධයෙන් විරෝධතාවයක් යම් අපේක්ෂකයෙකු ඉදිරිපත් කරන්නේ නම් එය මැතිවරණ කාර්යය මණ්ඩලය ඔස්සේ ඡන්දපොළ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එම විරෝධතාවය මැතිවරණ කමිටුව විසින් ජාතික මැතිවරණ මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු නැවත ඡන්දය ගණනය කිරීමක් සඳහා අවස්ථාව ලැබෙනු ඇත. මෙහිදී විරෝධතා ගොනු කිරීමට රු. 25,000.00 ක ඇප මුදලක් තැන්පත් කළ යුතු අතර එම මුදල මැතිවරණ ජයග්‍රහනය කළ අපේක්ෂකයා වෙනස් වීම දක්වා බලපාන්නේ නම් පමණක් ආපසු ලබා දෙනු ඇත.

එසේ නැවත ගණනය සඳහා සලකා බලනුයේ එම මධ්‍යස්ථානයේ ඡන්ද පත්‍රිකා මගින් සලකුණු කරන ලද ඡන්දය වන අතර ඒ අනුව අවසන් නිල ප්‍රතිඵලය ප්‍රකාශ කරනු ඇත.

10. ජාතික මැතිවරණ කමිටුව

I. තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ නියෝජිත
II. ජාතික තරුණ සේවා සභාවේ සභාපති හෝ නියෝජිත
III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති හෝ නියෝජිත
IV. ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ලේකම් හෝ නියෝජිත
V. ස්වේච්ඡා සංවිධාන නියෝජිත
VI. පරිගණක දත්ත විශ්ලේෂක

11. ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයෙකු වශයෙන් තේරී පත් වීම

ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ නියෝජිතයෙකු වශයෙන් තේරී පත් වීමට වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගැනීම සුදුසුකම වේ. ඒ අනුව එක් නියෝජිතයෙක් තෝරා ගන්නා අවස්ථාවක වැඩි ම ඡන්ද ලබා ගත් අපේක්ෂකයා මන්ත්‍රී ධූරයට තේරී පත් වන අතර නියෝජිතයින් දෙදෙනෙකු තෝරා ගනු ලබන අවස්ථාවක ඡන්දය ක්‍රියාත්මක කරනු ලබන විශ්වවිද්‍යාල තුල එහි පීඨ අතරින් වෙනස් වූ පීඨයන් දෙකක වැඩිම ඡන්ද ලබා ගන්නා අපේක්ෂකයින් වේ.

12. අපේක්ෂකයින් දෙදෙනෙකු එක හා සමාන ඡන්ද ප්‍රමාණයක් ලබා ගෙන තරුණ පාර්ලිමේන්තුව සඳහා තේරී පත් වීමට සුදුසුකම් ලැබීම

මෙවන් අවස්ථාවක දී ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව නිල කාල සීමාව නියෝජිතයන් දෙදෙනා අතර සමව බෙදී යන ආකාරයට අවස්ථාව හිමි කර දෙනු ඇත. මෙහිදී ප්‍රථම කාල සීමාව සහ දෙවන කාල සීමාව තෝරා ගැනීම සඳහා කාසියේ වාසිය විමසා බැලීමෙන් සිදු වේ. එමෙන් ම තේරී පත් වන මන්ත්‍රීවරුන් වෙත පොදු දැනුවත් කිරීම් සහ පුහුණු වැඩමුළු සඳහා දෙදෙනා ම සහභාගී කරගනු ලැබේ.

ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනය ආශ්‍රිතව නියෝජිතයින් තෝරා පත් කර ගැනීම උදෙසා ක්‍රියාත්මක වන ක්‍රමවේදය මෙහි අංක 1 සිට 12 දක්වා ඊට අයත් අනුශාංගික කරුණු හා ඇමුණුම් අංක 1 යටතේ වන අයදුම්පත්‍රය ද සමග තොරතුරු දක්වා ඇති අතර ඒ පිළිබඳව නිවැරදි අධ්‍යයනයකින් යුතුව කටයුතු සිදු කළ යුතු වේ. එමෙන්ම මෙම නියෝජිතයින් තෝරා පත් කර ගැනීමේ දී සිදු වන අක්‍රමිකතා විනය විරෝධී ක්‍රියා සහ නීති උල්ලංඝනය වීමේ අවස්ථාවන්හිදී දිස්ත්‍රික්, ජාතික කමිටු නිර්දේශ මත අවසන් තීරණය ගැනීමේ බලය ජාතික තරුණ සේවා සභාවේ සභාපති / අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ.

**<u>ආකෘති අංක 01</u>**

<u>ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව අපේක්ෂක නාම යෝජනා පත්‍රය</u>

1. සම්පූර්ණ නම
   සිංහල - ..............................................................................................................
   English - ..............................................................................................................

2. මුලකුරු සමඟ නම
   සිංහල - ..............................................................................................................
   English - ..............................................................................................................

3. උපන් දිනය - ................................ 2020.03 01.දිනට වයස අවුරුදු ........................ -

4. E-mail ලිපිනය - ........................ - දුරකථන අංකය ........................................................

5. විශ්වවිද්‍යාලයේ/ උසස් අධ්‍යාපන ආයතනයේ නම- ............................................................................

6. උපාධි පාඨමාලාවේ/ පාඨමාලාවේ නම - ........................................................................................

   මූලික විෂයන් - ..........................................................................................
   ..........................................................................................
   ..........................................................................................

7. ලියාපදිංචි වර්ෂය හා පීඨය ..................................................................................................
8. ජාතික හැඳුනුම්පත් අංකය - .................................... ශිෂ්‍ය හැඳුනුම්පත් අංකය - ......................................
9. පෞද්ගලික ලිපිනය - ............................................................................................................
   ............................................................................................................
10. තාවකාලිකව පදිංචි නම් එම ලිපිනය - ..........................................................................................
    ..........................................................................................
    (නේවාසිකාගාරය හෝ නවාතැන)
11. දිස්ත්‍රික්කය - ................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - .........................

    ග්‍රාම නිළධාරී වසම - ................................

12. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ යම් වරදක් සම්බන්ධයෙන් දඬුවම් ලබා තිබේ ද? ඔව් / නැත
13. මීට ඉහතදී ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව නියෝජනය කර තිබේද ? ඔව් නැත /
14. මව හෝ පියා හෝ සහෝදර සහෝදරියන් මහජන නියෝජිතයෙකු ලෙස නිරත වී සිටීද ? ඔව් / නැත
    (පලාත් පාලන, පලාත් සභා පාර්ලිමේන්තු)

මා විසින් ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, යම් හෙයකින් මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබුනේ නම් මාගේ අපේක්ෂකධූරය හෝ ජයක්ග්‍රහනය කර තරුණ පාර්ලිමේන්තුවේ තනතුරක් දරන අවස්ථාවක වුවද එය අහෝසි වන බව මා හොඳින් දන්නා බවත්, ඒ උදෙසා මාගේ එකගතාවයත්, මේ සමග අමුණා ඇති ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු නියෝජිතයින් සඳහා වන ආයතනික නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙසේ සහතික වන්නේය.

...................................... ...................................

දිනය අත්සන

(සැ.යු -සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම පදනම්ව සිදු කරනු ලබන නිරීක්ෂණයක දී ජාතික තරුණ සේවා සභාවේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ තීරණය අවසාන තීරණය වේ)